**කොළඹ නාලන්ද විද්‍යාලයීය විශ්‍රාමික ගුරු සංගමය**
(ආරම්භය 1991 පෙබරවාරි 04 වන දින)
ව්‍යවස්ථාව

**1.** **නම,** :කොළඹ නාලන්ද විද්‍යාලයීය විශ්‍රාමික ගුරු සංගමය

**2.** **ලිපිනය,** :909/10, කේ. අදිකාරම් මාවත, ඇතුල්කෝට්ටේ

**3.** **ලාංඡනය,** **:**

4. **ආදර්ශ පාඨය,** :ධම්මචාරි සුඛං සේති, ධර්මානුකූල ව හැසිරෙන තැනැත්තා සුව සේ කල් ගෙවයි.

**5.** **පරමාර්ථ,**

1. නාලන්ද විද්‍යාලයීය විශ්‍රාමික ගුරු භවතුන් සංගමයක් වශයෙන් ඒකරාශි ව තබා ගැනීම.
2. සාමාජික භවතුන් අතර සුහදතාවය පවත්වා ගැනීමටත් ඔවුන්ගේ සුබසාධනයටත් කටයුතු කිරීම.
3. ආගමික හා සමාජ සේවා කාර්යයන් සඳහා සංගමයක් වශයෙන් සාමාජිකත්වය යොමු කිරීම.

**6.** **සාමාජිකත්වය,**
කොළඹ නාලන්ද විද්‍යාලයේ අවම වශයෙන් අවුරුදු තුනක (3) සේවයෙන් පසු එහි දීම විශ්‍රාම ලැබූ හෝ වෙනත් ආයතනයකින් විශ්‍රාම ලැබූ හෝ ගුරු භවතුන්ට සංගමයේ සාමාජිකත්වය ලබා ගත හැක.

**7.** **සාමාජික මුදල,**
රුපියල් දහසක්(1000/-)එකවර ගෙවා සාමාජිකත්වය ලබා ගත හැකිය. සාමාජිකත්වය ලබා වසරක් සම්පූර්ණ වූ දින සිට වසරකට රුපියල් දහක් (1000/-) බැගින් වසරක් පාසා දයක මුදල් ගෙවිය යුතුය.

**8.** **නිලධාරී මණ්ඩලය,**

1. අනුශාසකවරු- සංගමයේ සාමාජිකත්වය ලබාගත් නාලන්ද විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරු.
2. සභාපති 3. උප සභාපතිවරු දෙදෙනෙක් 4. ලේකම් 5. උපලේකම්
6. භාණ්ඩාගාරික7. උප භාණ්ඩාගාරික 8.ගිණුම් පරීක්ෂක 9. සංස්කාරක

සාමාජිකයින් පස් (5) දෙනෙක් සහ සාමාජිකාවන් පස් (5) දෙනෙක් ඇතුළු කාරක සභිකයින් දස දෙනෙක් (10)සමග දහනව (19) දෙනෙකුගෙන් විධායක කමිටුව සමන්විත යුතු ය.

- සංගමයේ සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන තනතුරු වලට පත්වීමට අවම වශයෙන් අවුරුදු තුනක් (3) වත් කාරක සභාවේ සාමාජිකත්වය දරා සිටිය යුතු ය.
- කාරක සභාවට පත්වීමට අවම වශයෙන් අවුරුදු දෙකක් වත් සාමාජිකත්වය දරා තිබිය යුතු ය.
- තනතුරු වෙනස් කිරීමේ දී සභාපති, ලේකම්, භාණ්ඩාගාරික යන ප්‍රධාන තනතුරු වලින් එක් වසරක දී වෙනස් කල හැක්කේ එක් තනතුරක් පමණි.

**9.** **වාර්ෂික මහා සභා රැස්වීම,**
සෑම වසර කම පෙබරවාරි මස අවසන් වීමට පෙර වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු ය. කැඳවීමේ ලිපිය දින 14කට කලින් සාමාජිකයින්ට යැවිය යුතු ය. අදළ වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන් පිළිබඳ වාර්ෂික වැඩ වාර්තාව ද ඉකුත් වාර්ෂික මහා සභා රැස්වීමේ වාර්තාව ද ගරු ලේකම් විසින් මෙහි දී ඉදිරිපත් කළ යුතු ය. වාර්ෂික රැස්වීමට අවශ්‍ය ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් (තුනෙන් එකක්) විය යුතු ය. අභිනව වර්ෂය සඳහා නිලධාරීන් තෝරා ගැනීම ද මෙම රැස්වීමේ දී සිදු කල යුතු ය. සාමාජික භවතුන් මෙ දින ඉදිරිත් කිරීමට බලාපොරොත්තු වන යෝජනා වාර්ෂික රැස්වීමට දින 7කට කලින් ලේකම් වෙත එවිය යුතු ය. එසේ ඉදිරිපත් කරන යෝජනා විධායක කමිටුව අනුමත කලොත් පමණක් වාර්ෂික මහ සභා රැස්වීමට ඉදිරිපත් කිරීමට හැකිය.

**10.** **විධායක කමිටු රැස්වීම්,**
විධායක කමිටු රැස්වීම් මසකට වරක් පැවැත්විය යුතු ය. එහි ගණපූරණය සඳහා අවශ්‍ය සාමාජික සංඛ්‍යාව (10) දහයකි. මාසික රැස්වීම් වලට අමතරව අවශ්‍යතාවයන් අනුව විශේෂ කමිටු රැස්වීම් කැඳවිය හැක. රැස්වීම් කැඳවිය යුත්තේ සභාපති හා භාණ්ඩාගාරිකගේ අනුමැතිය ඇතිව ලේකම් විසිනි. සාමාජිකත්වයෙන් තුනෙන් එකක සාධාරණ ඉල්ලීමක් මත විශේෂ මහ සභා රැස්වීමක් කැඳවීමට විධායක කමිටුවට බලය තිබේ

**11.** සංගමයේ මුදල්,

1. සංගමයට ලැබෙන සෑම මුදලක් සඳහා ම සංගමයේ මුද්‍රිත ලදු පතක් භාණ්ඩාගාරික විසින් නිකුත් කල යුතු ය.
2. සංගමයට ලැබෙන මුදල් විධායක කමිටුව අනුමත කරන බැංකු ගිණුම් වල තැන්පත් කල යුතු ය.
3. මුදල් ආපසු ලබා ගැනීමේ දී භාණ්ඩාගාරිකගේ අත්සන සහ සභාපති/ලේකම් යන දෙදෙනාගෙන් එක් අයකුගේ අත්සන ද තිබිය යුතු ය.
4. සංගමයේ මුදල් වර්ෂය පෙබරවාරි මස 01 වැනිදා සිට ඊලඟ වසරේ ජනවාරි මස 31 වැනිදා දක්වා වේ.
5. විගණනය කරන ලද ගිණුම් වාර්තාව වාර්ෂික මහ සභා රැස්වීමේ දී භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කළ යුතු ය.
6. සංගමයේ එදිනෙදා වියදම් සඳහා රුපියල් පන්දහසක(5000/-)ට නො වැඩි මුදලක් භාණ්ඩාගාරික ලඟ තබා ගත හැක.
7. විධායක කමිටුවේ ආවරණ අනුමැතියට යටත් ව භාණ්ඩාගාරිකට එක් වතාවක දී වියදම් කල හැකි මුදල රුපියල් දසදහසකි(10, 000/-) කි.
8. විධායක කමිටු රැස්වීමේ දී මාසික අයවැය වාර්තාවක් භාණ්ඩාගාරික විසින් ඉදිරිපත් කල යුතු ය.
9. සංගමයේ මුදල් ගනුදෙනු පිළිබඳ සියලු ම ලියකියවිලි වල පිටපත් අඩංගු ලිපි ගොනුවක් ලේකම් භාරයේ තැබිය යුතු ය.

**12.** සංගමයෙන් කෙරෙන වියදම් හා ප්‍රදානයන්

<u>වාර්ෂික පරිත්‍යාග</u>

1. වාර්ෂික සභා රැස්වීමට පෙර සංගම් මූලස්ථානයේ හෝ වෙනත් ස්ථානයක මහා සංඝරත්නය විෂයෙහි සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීම.
2. පැල්මඩුල්ලේ මිතුරු මිතුරෝ ආයතනය මගින් වාර්ෂිකව පවත්වන ගුරු උපහාර උළෙලේ දී එම ආයතනයට පරිත්‍යාගයක් කිරීම.
3. සර්වෝදය සුවසෙත ළමා නිවාසයට වාර්ෂිකව රුපියල් දෙදහක(2000/-) මුදල් පරිත්‍යාගයක් කිරීම.
4. රාජගිරියේ වික්ටෝරියා නිවාසයේ රෝගීන්ට වාර්ෂිකව ජනවාරි මස 25 වැනිදා දිවා ආහාර සඳහා බරපැන දැරීම.

<u>අවමංගල්‍යාධාර පිරිනැමීම</u>

1. සාමාජික භවතෙකුගේ අභාවයක දී රුපියල් පහළොස් දහසක(15 000/-) මුදලක් පරිත්‍යාග කිරීම.
2. මෙහි දී සාමාජිකත්වයේ කාල සීමාව ගැන සැලකිලිමත් නො කෙරේ.
3. මුදල් ලබා දෙන්නේ සාමාජිකයාගේ කලත්‍රයාට හෝ එම පවුලේ මව පියා හෝ දරුවෙකු වෙත පමණි.
4. එම සාමාජිකයාගේ අවමංගල අවස්ථාවට සංගමය නියෝජනය වන පරිදි සහභාගි වන කණ්ඩායමේ ගමන් වියදම් සංගමයෙන් ගෙවිය යුතු ය.

<u>වෛද්‍යාධාර පිරිනැමීම</u>

1. සාමාජික භවතෙකු රෝගාතුර වූ බව විධායක කමිටුව දැනුවත් වූ විට ඔහු/ඇය වෙනුවෙන් පහළොස් දහසක(15 000/-) මුදලක් පිරිනැමීමට කටයුතු කරනු ඇත.
2. වෛද්‍යාධාර ලැබීමට අවම වශයෙන් වසරක සාමාජිකත්වයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.
3. සාමාජිකත්වයේ වසරකට රු 3 000/- බැගින් උපරිමය රු 15 000/-කට යටත් ව පිරිනැමිය යුතු ආධාර මුදල විධායක කමිටුව විසින් තීරණය කරනු ඇත.
4. සාමාජිකයෙකුට හිමිකම් ඇත්තේ වෛද්‍යාධාර හෝ අවමංගල්‍යාධාර යන දෙකෙන් එකක් පමණි.

සියළුම පරිත්‍යාගයන් සංගමයේ පරමාර්ථයන්ට අනුකූලව අරමුදලේ තත්වය අනුව විධායක කමිටුවේ ඒකමතික තීරණය මත කළ යුතු ය.

**13.** වාර්ෂික චාරිකා

1. සංගමය සංවිධානය කරන සාමාජිකත්වයට පමණක් සීමාව එක් දින චාරිකාවේ හා සුහද හමුවේ පිරිවැයෙන් කොටසක් අවශ්‍ය පරිදි සංගමයෙන් දැරිය යුතු ය.
2. ඒක පුද්ගල සම්පූර්ණ මුදල ගෙවා කලත්‍රයාට ද මෙම අවස්ථාවට සහභාගි විය හැක.
3. මෙයට අමතරව වසරකට දින දෙකේ හෝ තුනේ චාරිකා සංවිධානය කිරීම. මෙම චාරිකා වලට සාමාජිකයා සමග පවුලේ සාමාජිකයන්ට ද සහභාගි විය හැක. මෙම චාරිකා වල දී සියලු ම වියදම් සහභාගි වන්නන් විසින් දැරිය යුතු ය.

**ව්‍යවස්ථා සංශෝධනයක් කළ හැක්කේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තුනෙන් දෙකක (2/3ක) බහුතර ඡන්දයකින් පමණි.**

**2014.02.23 වන දින සිට ක්‍රියාත්මකයි.**